**කළුතර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා කාරක සභා 20 - 2024**
**--------------------------------------------------------------------------**

**1. විගණන මතය**

**1.1** කළුතර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා කාරක සභා 20 ක 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශන සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශන, මුදල් ප්‍රවාහ ප්‍රකාශන සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනතේ 58(1) වගන්තියේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2** කළුතර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා කාරක සභා 20 කට අදාලව නිකුත් කර තිබුණු විගණන වාර්තා 20 න් කාරක සභා 02 ක අභිතකර මතයක් ද, කාරක සභා 08 ක් සඳහා මතය ව්‍යාවනය කිරීමද, ඉතිරි කාරක සභා 10 සඳහා තත්ත්වාගණනය කළ මතයක්ද ප්‍රකාශ කර ඇති අතර, අභිතකර මතය, මතය ව්‍යාවනය කිරීම හා තත්ත්වාගණනය කළ මතය සඳහා හේතු වී තිබූ ප්‍රමාණාත්මක දෝෂයන් පහත දැක්වේ.

**1.3 මූල්‍ය ප්‍රකාශන**

**1.3.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත ඇතුලත්ව ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අනුකූල නොවීම**

| | විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 01 හි සඳහන් අංක 99 සිට 139 දක්වා වූ වගන්ති ප්‍රකාරව, කාරක සභා 20 හි ම ගොවිජන බැංකු විසින් මූල්‍ය ප්‍රකාශන සමග මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය සකස් කර නොතිබුණි. | දෙපාර්තමේන්තුව ලබාදුන් උපදෙස් අනුව සකස් කර ඇත. ඉදිරියේදී නිවැරදිව සකස් කර ඉදිරිපත් කරමි. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 01 ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන සකස් කර ඉදිරිපත් කළ යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරන ප්‍රමිති අංක 01 හි සඳහන් 118 සිට 125 දක්වා වූ වගන්ති ප්‍රකාරව 2024 වර්ෂය සඳහා කාරක සභාව සහ ගොවි බැංකු 20 සඳහා ම ශුද්ධ වත්කම් වෙනස් වීමේ ප්‍රකාශනයක් පිළියෙල කර මූල්‍ය ප්‍රකාශන සමග ඉදිරිපත් කර නොතිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කරමි. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 01 ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන සකස් කර ඉදිරිපත් කළ යුතුය. |
| (ඇ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 02 ට අනුකූලව ප්‍රධාන මුදල් ප්‍රවාහ හඳුනාගෙන වර්ගීකරණය කිරීමකින් තොරව ගොවිජන බැංකු 11 ක සහ කාරක සභා 04 ක මුදල් ප්‍රවාහ ප්‍රකාශන පිළියෙල කර මූල්‍ය ප්‍රකාශන සමග ඉදිරිපත් කර තිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කරමි. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 02 ප්‍රකාරව මුදල් ප්‍රවාහ ප්‍රකාශය සකස් කර ඉදිරිපත් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඈ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 03 ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී භාවිතා කළ සියළු ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශන කට්ටලය තුල සටහන් කල යුතු වුවත්, කාරක සභා 07 ක හා ගොවිජන බැංකු 09 ක මූල්‍ය ප්‍රකාශනවල සියළුම ගිණුම් ප්‍රතිපත්ති සටහන් කර නොතිබුණි. | 2025 වර්ෂයේදී නිවැරදිව සටහන් කරමි. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 03 ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශනවල ගිණුම් ප්‍රතිපත්ති හෙළිදරව් කළ යුතුය. |

## 1.3.2 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගොවිජන බැංකු 16 ක 2024 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ දී රු.82,000 ක් වූ උපචිත වියදම් 2024 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු වියදම් ලෙස ගිණුම්ගත කර නොතිබුණු අතර, 2023 වර්ෂයට අදාළව 2024 වර්ෂයේ ගෙවන ලද රු.80,000 ක වියදම සමාලෝචිත වර්ෂයේ වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණි. | 2025 වර්ෂයේදී සොයා බලා නිවැරදි කිරීමට කටයුතු කරමි. | උපචිත වියදම් නියමිත ගිණුම් වර්ෂයට අදාළව ගිණුම්ගත වන බව තහවුරු වන අභ්‍යන්තර වැඩපිළිවෙළක් සකස් කළ යුතුය. |
| (ආ) | කාරක සභා 16 ක 2024 වර්ෂයට අදාළව 2025 වර්ෂයේදී ගෙවන ලද එකතුව රු.3,169,338 ක උපචිත වියදම් මූල්‍ය ප්‍රකාශනවල 2024 වර්ෂයේ වියදම් ලෙස ගිණුම්ගත කර නොතිබුණ හෙයින් උපචිත වියදම් අඩුවෙන් හා අතිරික්තය වැඩියෙන් පෙන්වා තිබුණි. | සොයා බලා නිවැරදි කිරීමට කටයුතු කරමි. | - එම - |
| (ඇ) | 2024 වර්ෂයේදී ගොවිජන බැංකු 13 කට අදාළව පරිගණක උපාංග මිලදී ගැනීම සඳහා දරණ ලද එකතු වටිනාකම රු.520,317 ක මුදලක් සහ 2023 වර්ෂයේදී එම කාර්ය සඳහාම ගොවි බැංකු 10 ක් මගින් දරණ ලද එකතුව රු.1,942,050 ක මුදලක් සමුච්චිත අරමුදල හර කිරීම නිසා එම වටිනාකමින් සමුච්චිත අරමුදල සහ වත්කම් ගිණුමේ ශේෂය අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | ප්‍රධාන කාර්යාලය මගින් උපදෙස් ලබාගෙන නිවැරදි කරමි. | සමුච්චිත අරමුදල් ගිණුමේ ශේෂය සහ වත්කම් ගිණුමේ ශේෂය නිවැරදි කළ යුතුය. |
| (ඈ) | ලිපිගොනු මගින් හෝ වෙනත් ආකාරයකින් සනාථ නොවූ කාරක සභා 17 ක එකතුව රු.8,225,653 ක් වූ වගකීම් සහ කාරක සභා 18 ක භෞතික පැවැත්මද නොමැති එකතුව රු.7,082,815 ක වත්කම් මූල්‍ය ප්‍රකාශනවල වත්කම් හා වගකීම් ලෙස ඇතුළත් කර තිබුණි. | ව්‍යාජ වත්කම් හා ව්‍යාජ වගකීම් ඉවත් කර ගිණුම්ගත කරමි. | විධිමත් පරිදි කටයුතු කර ශේෂයන් තහවුරු කර ගැනීමෙන් පසු මූල්‍ය ප්‍රකාශන නිවැරදි කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | 2024 වර්ෂයේ අක්කර බදු අදායම ගිණුම්ගත කිරීමේදී කාරත සභා 12 ක එකතුව රු.554,396 ක් අඩුවෙන්ද තවත් කාරක සභා 06ක එකතුව රු. 192,345 ක් වැඩියෙන් ද ගිණුම්ගත කර තිබුණි. | සොයාබලා නිවැරදි කරමි. | විධිමත් පරීක්ෂණයක් කර ගිණුම් වර්ෂයට අදාළ නිවැරදි අක්කර බදු අදායම හදුනාගෙන ගිණුම්වල නිවැරදි කළ යුතුය. |
| (ඊ) | ඉත්තෑපාන කාරක සභාව සමාලෝචිත වර්ෂය තුළ දී එකතුව රු.144,437 ක ස්ථාවර වත්කම් මිලදී ගෙන වත්කම් ගිණුම හර කිරීම වෙනුවට වියදම් ගිණුම හර කර ගිණුම්ගත කර තිබීම හේතුවෙන් වත්කම් ගිණුම් ශේෂය හා අතිරික්තය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. තවද මිලදී ගත් වත්කම් ස්ථාවර වත්කම් ලේඛනයට ද ඇතුළත් කර නොතිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කරමි. | විධිමත් පරිදි ගිණුම්වල ගලපා මෙම ස්ථාවර වත්කම් මිලදී ගැනීම වියදමක් ලෙස ගිණුම් තැබීම නිවැරදි කළ යුතුය. |

### 1.3.3 නොසැසඳුනු පාලන ගිණුම් හෝ වාර්තා

| | විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කාරක සභා 11 ක ගිණුම් විෂයයන් 36 කට අදාළව මූල්‍ය ප්‍රකාශන හා අනුරූපී වාර්තා අතර, ශේෂයන්හි එකතුව රු.4,520,471 ක නොසැසඳුනු ශේෂයක් පැවතුණි. | 2025 ගිණුම් වාර්තාවල නිවැරදි කිරීමට කටයුතු කරමි. | විධිමත් පරිදි කටයුතු කර ගිණුම් හෝ අනුරූපී වාර්තා නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |

### 1.3.4 අධිකාරී බලය නොලත් ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ජ'නල් සටහන් මගින් ගිණුම් තැබීමේදී ජ'නල් සටහන් පත්‍ර සහ ජ'නල් වවුචර් යොදා පූර්ව අනුමැතිය ලබා ගෙන ගනුදෙණු ගිණුම්ගත කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂය තුළ ගොවිජන බැංකු 05 ක් මගින් ගිණුම්ගත කළ ජ'නල් සටහන් 261 ක් සඳහාත් කාරක සභා 03 ක් මගින් 2024 වර්ෂයේ ගිණුම්ගත කළ සියළුම ජ'නල් සටහන් සඳහාත් ජ'නල් වවුචර් යෙදීම හා පූර්ව අනුමැතිය ලබාගැනීමෙන් තොරව එම ගනුදෙණු ගිණුම්ගත කර තිබුණි. | 2025 වර්ෂයේදී ජ'නල් වවුචර් පිළියෙල කර අනුමැතිය ලබාගෙන ගනුදෙණු ගිණුම්ගත කරමි. | මේ සම්බන්ධයෙන් පරීක්ෂා කර නිලධාරීන් දැනුවත් කිරීමත්, ජ'නල් සටහන් යෙදීමේදී උපකාර ලේඛන සහිතව ජ'නල් වවුචර් සකස් කර අනුමැතිය ලබා ගැනීමෙන් පසු ජ'නලයේ සටහන් යොදන බව තහවුරු වන වැඩපිළිවෙළක් සකස් කිරීමත් කළ යුතුය. |

### 1.3.5 අවිනිශ්චිත ගිණුම්

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමට ප්‍රථම අවිනිශ්චිත ගිණුම් ශේෂ හඳුනාගෙන නිරවුල් කළ යුතු වුවත්, ඉත්තෑපාන ගොවිජන බැංකුවේ රු.52,614 ක අවිනිශ්චිත ශේෂයක් සහ වලගෙදර කාරක සභාවේ රු.30,806 ක අවිනිශ්චිත ශේෂයක් හඳුනාගෙන නිරවුල් කිරීමකින් තොරව මූල්‍ය ප්‍රකාශන සකස් කර තිබුණි. | 2025 වර්ෂයේදී නිරවුල් කිරීමට කටයුතු කරමි. | විධිමත් පරීක්ෂාවක් සිදු කර අවිනිශ්චිත ගිණුම් ශේෂ හඳුනාගෙන ලෙජරය නිවැරදි කළ පසුව මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමට කඩිනම් පියවර ගත යුතුය. |

### 1.3.6 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| | විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | 2024 දෙසැම්බර් 31 දිනට ගොවිජන බැංකු 09 ක මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ සටහන් කර තිබූ එකතු වටිනාකම රු.55,906,253 ක් වූ ගොවීන් 1709 දෙනෙකු වෙත ලබා දුන් විවිධ ණය ශේෂවල නිරවද්‍යතාවය පරීක්ෂා කිරීම සඳහා වූ ප්‍රමාණවත් ලිඛිත සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | ලිඛිත සාක්ෂි ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. | ණය ශේෂ නිරවද්‍යතාව පරීක්ෂාව සඳහා අදාල සාක්ෂි ඉදිරිපත් කළ යුතුය. |
| (ආ) | 2024 දෙසැම්බර් 31 දිනට ගොවිජන බැංකු 08 ක මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ සටහන් කර තිබූ එකතු වටිනාකම රු.30,113,027 ක් වූ ගොවීන් 2743 දෙනෙකුට අදාළ විවිධ තැන්පතු ශේෂවල නිරවද්‍යතාවය පරීක්ෂා කිරීම සඳහා වූ ප්‍රමාණවත් ලිඛිත සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | තැන්පතු ශේෂ පරීක්ෂාව සඳහා අවශ්‍ය සාක්ෂි ඉදිරිපත් කරමි. | - එම - |
| (ඇ) | 2024 දෙසැම්බර් 31 දිනට ගොවිජන බැංකු 08 ක මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ සටහන් කර තිබූ එකතු වටිනාකම රු.7,784,722 ක් වූ ගොවීන් 7304 දෙනෙකුට අදාළ කොටස් මුදල් ශේෂයේ නිරවද්‍යතාවය පරීක්ෂා කිරීම සඳහා වූ ප්‍රමාණවත් ලිඛිත සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | කොටස් ශේෂ පරීක්ෂා කිරීමට අවශ්‍ය සාක්ෂි ඉදිරිපත් කරමි. | කොටස් ශේෂවල නිරවද්‍යතාවය පරීක්ෂාව සඳහා විගණනය විසින් ඉල්ලුම් කරන ලද ලිඛිත සාක්ෂි ඉදිරිපත් කළ යුතුය. |
| (ඈ) | 2024 දෙසැම්බර් 31 දිනට ගොවිජන බැංකු 10 ක මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ සටහන් කර තිබූ එකතු වටිනාකම රු.8,464,121 ක් වූ ගොවීන් 8692 දෙනෙකුට අදාළව සාමාන්‍ය පුද්ගල තැන්පත් ශේෂයේ නිරවද්‍යතාවය පරීක්ෂා කිරීම සඳහා වූ ප්‍රමාණවත් ලිඛිත සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | සාමාන්‍ය තැන්පතු ශේෂ පරීක්ෂා කිරීමට අවශ්‍ය සාක්ෂි ඉදිරිපත් කරමි. | තැන්පත් ශේෂවල නිරවද්‍යතාවය පරීක්ෂාව සඳහා විගණනය විසින් ඉල්ලුම් කරන ලද ලිඛිත සාක්ෂි ඉදිරිපත් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | බණ්ඩාරගම කාරක සභාවේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ස්ථාවර වත්කම් ලෙස සටහන් කර තිබූ එකතු වටිනාකම රු.1,290,780 ක් වූ කාර්යාල උපකරණ හා විවිධ වත්කම්වලට අදාළව උපලේඛන හා ස්ථාවර වත්කම් ලේඛන විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එහි නිරවද්‍යතාවය පරීක්ෂා කිරීමට නොහැකි විය. | පිළිගනිමි | වත්කම් භෞතික පරීක්ෂාව පිළිබඳ ප්‍රමාණවත් ලිඛිත සාක්ෂි හෝ සමීක්ෂණ මණ්ඩල වාර්තා ඉදිරිපත් කළ යුතු අතර, උපලේඛන හා ස්ථාවර වත්කම් ලේඛන ඉදිරිපත් කළ යුතුය. |
| (ඊ) | පාඩාගොඩ, පැලවත්ත, බුලත්සිංහල සහ මිල්ලනිය යන ගොවිජන බැංකුවල ව්‍යාපෘති ණය, කෘෂි ණය, ව්‍යවසායක ණය, සාරලංකා ණය සහ කාන්තා ගොවි සංවිධාන තැන්පත් උප ලෙජර් ගිණුම් 2024 දෙසැම්බර් 31 දිනට තුලනය නොකිරීම නිසා 2024 මූල්‍ය ප්‍රකාශන සමග වූ එම උපලේඛනවල නිරවද්‍යතාවය පරීක්ෂා කළ නොහැකි විය. | නිවැරදි කිරීමට කටයුතු කරමි. | විධිමත් පරිදි කටයුතු නොකළ හා ඒවා අධීක්ෂණය නොකළ නිලධාරීන් සම්බන්ධ පියවර ගැනීමටත්, උප ලෙජර් ගිණුම් වාර්ෂිකව තුලනය කිරීම තහවුරු වන ක්‍රමවේදයක් ස්ථාපිත කිරීමත් කළ යුතුය. |

## 1.4 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනත | | | |
| 56 වගන්තිය | ගොවිජන සේවා කාරක සභා 11 ක් මගින් නීත්‍යානුකූලව අයකර ගත යුතු සියළුම අක්කර බදු මුදල් නියමිත පරිදි අයකර ගෙන නොතිබුණි. | පිළිගනිමි. | කාලීනව අක්කර බදු අය නොකළ නිලධාරීන් සම්බන්ධයෙන් විධිමත් පියවර ගැනීමටත්, ගොවිජන සංවර්ධන පනතේ විධිවිධාන ප්‍රකාරව අක්කර බදු මුදල් අයකර ගැනීමටත් ක්‍රියාකළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ II කාණ්ඩය | | | |
| XLVII පරිච්ඡේදයේ 5.3 ඡේදය සහ XLVIII පරිච්ඡේදයේ 31:1.7 වගන්තිය | මොරොන්තුඩුව සහ පැලවත්ත ගොවිජන බැංකුවල සේවය කළ කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර නිලධාරීන් විසින් ගොවිජන බැංකු මුදල් අවභාවිතා කර තිබුණි. | පිළිගනිමි. උපදෙස් අනුව කටයුතු කරමි. | ආයතන සංග්‍රහය ප්‍රකාරව විධිමත්ව කටයුතු කර විනය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| (i) මුදල් රෙගුලාසි 257 | කාරක සභා 08 ක එකතු වටිනාකම රු.3,096,611 ක් වූ ගෙවීම් වවුචර් පත් 99 ක් පූර්ව ගෙවීම සහතික කිරීමකින් තොරව ගෙවීම් කර තිබුණි. | පිළිගනිමි. | මුදල් රෙගුලාසි වලට පටහැනිව කටයුතු කළ නිලධාරීන්ට විධිමත් පියවර ගැනීමටත්, ඉදිරියේදී මුදල් රෙගුලාසිය ප්‍රකාරව ගෙවීම් වවුචර් සහතික කිරීම තහවුරු වන අභ්‍යන්තර පාලනය ශක්තිමත් කිරීමත් කළ යුතුය. |
| (ii) මුදල් රෙගුලාසි 396 | කාරක සභා 08 ක නිකුත් කළ නමුත් ගෙවීම සඳහා ඉදිරිපත් නොකරන ලද මාස 06 ඉක්ම වූ එකතුව රු.217,177 ක් වටිනා චෙක්පත් 20 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | පිළිගනිමි. | මුදල් රෙගුලාසිය ප්‍රකාරව නිකුත් කළ නමුත් ගෙවීම සඳහා ඉදිරිපත් නොවූ චෙක්පත් සම්බන්ධයෙන් කටයුතු කළ යුතුය. |
| (iii) මුදල් රෙගුලාසි 880 සහ 881 | කාරක සභා සහ ගොවිජන බැංකු 20 හි ම මුදල් භාරව කටයුතු කරන හා චෙක්පත්වලට අත්සන් කරනු ලබන නිලධාරීන් විසින් ඇප මුදල් තැන්පත් කිරීමට ක්‍රියාකර නොතිබුණි. | පිළිගනිමි. | මුදල් රෙගුලාසි ප්‍රකාර ඇප තැන්පත් කළ යුතු සියලු නිලධාරීන් කඩිනමින් ඇප තැබීම කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | 2012 පෙබරවාරි 29 දිනැති අංක 4/2012 දරන ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්ගේ චක්‍රලේඛයේ 5.6(1) ඡේදය | ගොවිජන බැංකුවට අදාළ සියලුම ගිණුම් ගොවිජන සේවා කාරක සභාවේ වාර්ෂික අවසන් ගිණුම්වලට ඇතුළත් කර ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතු වුවත්, ගොවිජන සේවා කාරක සභා 20ම එසේ කටයුතු කර නොතිබුණි. | පිළිගනිමි. | චක්‍රලේඛයේ 5.6 (1) ඡේදයේ උපදෙස් ප්‍රකාරව කටයුතු කළ යුතුයි. |
| (ඉ) | 2018 මැයි 05 දිනැති අංක 265/2018 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය සහ 2023 පෙබරවාරි 15 දිනැති අංක AGS/02-2023(1) දරන විගණකාධිපතිතුමාගේ චක්‍රලේඛයේ 04 ඡේදය | කාරක සභා සහ ගොවි බැංකු මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම "රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත" වුවත්, කාරක සභාවක සහ ගොවි බැංකුවක මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමට අදාළ ගිණුම්කරණ පදනම මූල්‍ය ප්‍රකාශන කට්ටලය තුළ සඳහන් කර නොතිබූ අතර, තවත් කාරක සභා 04 ක ගිණුම්කරණ පදනම් 02 ක් අදාළ කරගෙන මූල්‍ය ප්‍රකාශන සකස් කළ බව සටහන් කර තිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කරමි. | රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත මත පදනම්ව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතු අතර එය මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවලට අනුව 2024 වර්ෂයේ ගොවිජන සේවා කාරක සභා 17 ක එකතුව රු.9,739,353 ක අතිරික්තයක් හා කාරක සභා 03 ක එකතුව රු.471,143 ක ඌනතාවයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය හා ඌනතාවය පිළිවෙලින් රු.7,343,884 ක් හා රු.3,453,095 ක් විය. සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵල අනුව ගොවිජන බැංකු 19 ක එකතුව රු.3,548,285 ක අතිරික්තයක් හා එක් ගොවි බැංකුවක රු.569,419 ක ඌනතාවයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ගොවිජන බැංකු 20 හි අතිරික්තය රු.4,242,822 ක් විය.

### 2.2 මූල්‍ය ප්‍රතිඵල විශ්ලේෂණය

(අ) කාරක සභා 12 ක සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලවල එකතු වටිනාකම රු.8,032,722 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව එම කාරක සභා 12 හි ඉකුත් වර්ෂයේ අතිරික්තයේ එකතු වටිනාකම රු.6,116,251 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයන් හි රු.1,916,471 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයන්ට අක්කර බදු ආදායම් වැඩි වීම, ස්ථාවර තැන්පත් පොලී ආදායම් වැඩිවීම, අලෙවිහල් ආදායම් වැඩිවීම හා වියදම් අඩුවීම ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

(ආ) කාරක සභා 05 ක සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලයෙහි එකතු වටිනාකම රු.1,706,631 ක අතිරික්තයක් වුවත්, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවයේ එකතු වටිනාකම රු.874,992 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයන්හි රු.2,581,623 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයන්ට අක්කර බදු ආදායම් වැඩිවීම, පොහොර ආදායම් වැඩිවීම, අලුත්වැඩියා වියදම් අඩුවීම, ගාස්තු ආදායම් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

(ඇ) කාරක සභා 01 ක සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලවල එකතු වටිනාකම රු.82,382 ක ඌනතාවයක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තයේ එකතු වටිනාකම රු.1,209,693 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයන්හි රු.1,292,075 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට ආදායම් අඩුවීම, අලුත්වැඩියා වියදම් වැඩිවීම, වෙනත් වියදම් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

(ඈ) කාරක සභා 02 ක සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලවල එකතු වටිනාකම රු.388,761 ක ඌනතාවයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවයේ එකතු වටිනාකම රු.2,578,109 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයන්හි රු.2,189,342 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට අක්කර බදු ආදායම් වැඩිවීම, වෙනත් ආදායම් වැඩිවීම, පොහොර බෑමේ වියදම් අඩුවීම හා වෙනත් වියදම් අඩුවීම ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

(ඉ) ගොවිජන බැංකු 19 ක සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලවල එකතුව රු.3,548,285 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ එම බැංකුවල අතිරික්තයේ එකතු වටිනාකම රු.3,942,502 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලය රු.394,217 ක පිරිහීමක් නිරීක්ෂණය විය. ඒ සඳහා ගොවි බැංකු ආදායම් අඩුවීම සහ වියදම් වැඩි වීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි. තවද 2024 වර්ෂයේදී මොරොන්තුඩුව ගොවිජන බැංකුව පමණක් රු.569,419 ක ඌනතාවයක් ලබා තිබූ අතර ඊට ප්‍රතිරූපීව පෙර වර්ෂයේ අතිරික්තය රු.300,320 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයේ රු.869,739 ක පිරිහීමක් නිරීක්ෂණය විය. ඒ සඳහා ගොවිජන බැංකුවේ ආදයම් අඩුවීම සහ දරන ලද වියදම් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කෘෂිකර්ම හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය හා කෘෂිකර්ම දෙපාර්තමේන්තුව එක්ව ක්‍රියාත්මක කරනු ලැබූ "තිරසර ගෙවතු ලක්ෂයක් ඇති කිරීමේ ව්‍යාපෘතිය" යටතේ කාරක සභා 15 කට අයත් වසම් 423 ක තෝරාගත් ගොවීන් 2933 දෙනෙකු වෙත එළවළු බීජ හා පැළ නොමිලේ බෙදා දී තිබුණි. මෙම ව්‍යාපෘතිය යටතේ පැළ සහ බීජවලට අමතරව වෙනත් අවශ්‍ය ආධාර හා මග පෙන්වීම් ලබා දී නොතිබුණු අතර, මෙම ව්‍යාපෘතියට අදාළව කාරක සභාව විසින් පවත්වාගෙන ගොස් තිබූ දත්ත අනුව ව්‍යාපෘතිය සාර්ථක වූ බවට තොරතුරු වාර්තා කර නොතිබුණි. | පිළිගනිමි. | විධිමත් පරිදි අධීක්ෂණ කටයුතු සිදු කිරීමටත්, සංවර්ධන ව්‍යාපෘති සාර්ථක කර ගැනීමටත්, නියාමනයට අවශ්‍ය වාර්තා පවත්වා ගැනීමටත් කටයුතු කළ යුතුය. |
| (ආ) | දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා කාරක සභා 11 කට අයත් කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර වසම් 65 ක අක්කර බදු අයකිරීමේ ප්‍රගතිය පහළ මට්ටමක පැවතුණි. | හිඟ අක්කර බදු අයකර ගැනීමට කටයුතු කරමි. | අක්කර බදු කාලීනව අය නොකළ නිලධාරීන් සම්බන්ධව විධිමත් පියවර ගැනීමත්, අය විය යුතු අක්කර බදු මුදල් කඩිනමින් අයකර ගැනීමටත් ක්‍රියා කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | 2006 වර්ෂයේදී බස්නාහිර පළාත් කෘෂිකර්ම හා ඉඩම් අමාත්‍යාංශයෙන් කාරක සභා 09 ක් වෙත ලැබුණු අත් ට්‍රැක්ටර් 09 ක් වසර ගණනාවක සිට අක්‍රීය තත්ත්වයේ පැවති අතර, අදාළ ට්‍රැක්ටර් අලුත්වැඩියා කර ප්‍රයෝජනයට ගැනීමට හෝ අපහරණය කිරීමට ක්‍රියා කර නොතිබුණි. | පිළිගනිමි. | මෙම අත් ට්‍රැක්ටර් ප්‍රයෝජනයට ගැනීමට හෝ විධිමත් පරිදි කටයුතු කර අපහරණය කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | නාගොඩ කාරක සභාවේ බෝල මැටි කැණීම් සිදු කරන ඉඩම් නැවත යාවත්කාලීන කිරීම සිදුකරන තෙක් එක් ඉඩමක් වෙනුවෙන් රු.1,000,000 ක් නැවත ගෙවීමේ පදනම මත තැන්පතු මුදල් ලෙස රඳවා ගත යුතුව තිබුණි. තැන්පත්කරුවන් 13 දෙනෙකු විසින් එකතුව රු.13,000,000 ක මුදලක් 2019 සිට ඇප තැන්පත් ලෙස ලබා දී තිබුණි. මෙම තැන්පතු මුදල් නිදහස් කිරීමට නම් කැණීම් සිදුකළ වලවල් වසා ඉඩම යාවත්කාලීන කර වගා කටයුතු සිදුකළ යුතු විය. නමුත් තවදුරටත් කැණීම් කටයුතු කිරීම, වලවල් සම්පූර්ණයෙන් වසා නොමැති වීම, වගා කටයුතු සිදු නොකිරීම වැනි හේතු මත වසර 06 ක පමණ කාලයක සිට මෙම ඉඩම් යථා තත්ත්වයට පත් නොකිරීම නිසා පරිසර හානි ද සිදු වී තිබුණි. | ඉඩම් යථාවත් කර නොමැති බැවින් ඇප තැන්පත් නිදහස් කර නැත. | ඉඩම් යථාවත් කර වගාවන් සිදුකිරීමට පියවර නොගත් නිලධාරීන් සම්බන්ධ විධිමත් පියවර ගත යුතුය. |
| (ඉ) | බුලත්සිංහල ගොවිජන සේවා කාරක සභාවේ කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර වසම් 13 කට අදාළව රාජකාරි කටයුතු කරනු ලැබූ කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර නිලධාරීන් "ජියෝ ගොවියා" දත්ත පද්ධතියට තොරතුරු ඇතුළත් කිරීමට අවශ්‍ය මැනීම් කටයුතු සිදුකර නොතිබුණි. ඒ අනුව රාජකාරි කටයුතු පැහැර හරින ලද නිලධාරීන් සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගැනීම ද සිදුකර නොතිබුණි. | පිළිගනිමි | විධිමත් පරීක්ෂණයක් පවත්වා රාජකාරී ඉටු නොකළ නිලධාරීන් සම්බන්ධයෙන් පියවර ගැනීමත්, "ජියෝ ගොවියා" දත්ත පද්ධතියට තොරතුරු ඇතුළත් කර අවසන් කිරීමට පියවර ගැනීමත් කළ යුතුය. |
| (ඊ) | 2024 වර්ෂයේ දී කාරක සභා 03 කට අයත් කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර වසම් වෙනුවෙන් ගොවි සංවිධාන පිහිටුවීමට හා කාරක සභා 03 ක පිහිටුවා තිබූ ගොවි සංවිධාන 45 ක් 2024 වර්ෂය වෙනුවෙන් නිලවරණ පවත්වා නොතිබුණි. | පිළිගනිමි. | ගොවි සංවිධාන පිහිටුවීමටත් නිලවරණ පැවැත්වීමටත් ක්‍රියා කළ යුතුය. |

### 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගොවිජන සේවා කාරක සභා 19 හි 2024 වර්ෂය තුළ 'w' කාණ්ඩයේ වී වගා කරන කුඹුරු හෙක්ටයාර 17646 ක වී වගා කිරීමට සැලසුම් කර තිබුණද, හෙක්ටයාර 10752 ක් පමණක් වී වගා කිරීම නිසා හෙක්ටයාර් 6894 කින් ඉලක්කය ළඟාකර ගැනීමට නොහැකි වී තිබූ අතර, | ඉදිරියේදී වී වගාව වැඩිදියුණු කිරීමට කටයුතු කරමි. | නිලධාරීන්ගේ අධීක්ෂණය පුළුල් කර වගා ඉලක්ක ඉහළ නැංවීම සඳහා වැඩපිළිවෙළක් සකස් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | අගලවත්ත කාරක සභාවේ පමණක් ඉලක්කය ඉක්මවා හෙක්ටයාර 216 ක වැඩිපුර වී වගා කර තිබුණි. | | |
| (ආ) | වර්ෂය තුල ගොවිජන සේවා කාරක සභා 16 ක පුරන් කුඹුරු අක්කර 3185 ක වී වගා කිරීමට ඉලක්ක කර තිබුණද, වසර අවසාන වන විට අක්කර 2695 ක පුරන් කුඹුරු අස්වැද්දීමට ක්‍රියාකර නොතිබුණි. නමුත් කාරක සභා 04 ක අක්කර 61 ක ඉලක්කය ඉක්මවා පුරන් කුඹුරුවල වී වගා කර තිබුණි. | පුරන් කුඹුරු ඉලක්ක 2025 වර්ෂයේදී ළඟා කර ගැනීමට කටයුතු කරමි. | පුරන් කුඹුරුවල වී වගාව වැඩි දියුණු කිරීමට ඉලක්කගත විධිමත් වැඩපිළිවෙළක් සකසා ක්‍රියාත්මක කළ යුතුය. |
| (ඇ) | 2024 වර්ෂය තුල ගොවිජන බැංකු 20 ක ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබූ “සිතමු” කාන්තා වැඩසටහන් 444 ක් අතරින් වැඩ සටහන් 382 ක් ක්‍රියාත්මක කර තිබූ අතර, වැඩසටහන් 62 ක් ක්‍රියාත්මක කර නොතිබුණි. ක්‍රියාත්මක කළ වැඩසටහන්වලින් 99 ක ප්‍රගතිය සතුටුදායක මට්ටමක නොපැවතුණි. | සොයා බලා 2025 වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. | වැඩසටහන් ක්‍රියාත්මක නොකිරීමට අදාළ නිලධාරීන් සම්බන්ධයෙන් විධිමත් පියවර ගැනීමට හා ඒවා ක්‍රියාත්මක කිරීමටත්, සතුටුදායක මට්ටමින් නොපැවැත්වූ වැඩසටහන් සම්බන්ධයෙන් පසු විපරම් කිරීමත් කළ යුතුය. |
| (ඈ) | කාරක සභා 20 ක් මගින් සමාලෝචිත වර්ෂය තුළ එකතුව රු.230,300,749 ක් භාවිතා කර සුළු වාරිමාර්ග ව්‍යාපෘති 345 ක් ප්‍රතිසංස්කරණය කිරීමට සැලසුම් කර තිබුණි. වර්ෂය තුල එකතු වටිනාකම රු.94,863,617 ක් වූ සුළු වාරිමාර්ග ව්‍යාපෘති 161 ක් ප්‍රතිසංස්කරණය කර තිබූ අතර, ව්‍යාපෘති 184 ක් ප්‍රතිසංස්කරණය කර නොතිබුණි. නමුත් වර්ෂය තුළ වාරිමාර්ග දෙපාර්තමේන්තුව, ගොවි සංවිධාන සහ වෙනත් බාහිර පාර්ශවයන් මගින් එකතු වටිනාකම රු.61,886,535 ක් වූ සැලසුම් නොකළ සුළු වාරිමාර්ග ව්‍යාපෘති 78 ක් ප්‍රතිසංස්කරණය කර තිබුණි. | ප්‍රතිපාදන නොලැබීම මත ප්‍රතිසංස්කරණ කටයුතු සැලසුම් කළ පරිදි ඉටු කළ නොහැකි විය. | විධිමත් පරීක්ෂණයක් පවත්වා ව්‍යාපෘති ක්‍රියාත්මක නොකිරීමට වගකිව යුතු පාර්ශව වෙත පියවර ගැනීමත් වී වගාවේ වැඩි දියුණුව සඳහා සුළු වාරිමාර්ග ව්‍යාපෘති සැලසුම් කළ පරිදි ප්‍රතිසංස්කරණය කිරීමට ඉදිරි වර්ෂ සඳහා විධිමත් වැඩපිළිවෙළක් යෙදීමත් කළ යුතුය. |

**3.3 මතභේදයට තුඩු දෙන ගනුදෙනු**

| | විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගොවිජන සේවා කොමසාරිස් ජනරාල්ගේ 2024 මාර්තු 28 දිනැති අංක 2/2024 දරන කාර්යාලීය චක්‍රලේඛය පදනම් කරගෙන සමාලෝචිත වර්ෂය තුළ කාරක සභා 12 ක රාජකාරි කළ නිලධාරීන් 146 දෙනෙකු වෙත එකතුව රු.2,920,000 ක් විශේෂ අවුරුදු ණය ලෙස ලබා දී තිබුණි. සේවකයෙකුට රජයේ උත්සව අත්තිකාරම් මුදල් ලබා දීමේ වටිනාකම ද ඉක්මවා ලබා දී තිබූ මෙම උත්සව අත්තිකාරම් ණය ලබා දීම නිසා ගොවි බැංකුව පිහිටුවීමේ අරමුණ වූ ගොවීන්ට ණය ලබා දීමේ අරමුණ ඉටු නොවීමත් ඒ සඳහා බැංකුව සතු වන ද්‍රවශීලතාවය පහළ යාමටත් හේතු වී තිබුණි. | දෙපාර්තමේන්තු චක්‍රලේඛයකට අනුව ණය ලබා දී තිබුණි. | ගොවිජන බැංකු පිහිටුවීමේ අරමුණ වූ ගොවීන්ට ණය ලබා දීමට ප්‍රමුඛතාව දක්වමින් ණය ලබා දිය යුතුය. |

| | විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (ආ) | ගොවි බැංකුවක දෛනික අත ඉතිරි මුදල් සීමාව රු.50,000 ක් වුවද පැලවත්ත ගොවිජන බැංකුවේ 2024 වර්ෂයේ දෛනික මුදල් පොත පරීක්ෂා කිරීමේදී වර්ෂය පුරා එම සීමාව ඉක්මවා දෛනිකව රු.100,000 කට අධික මුදලක් අත රඳවාගෙන තිබුණි. 2024 මාර්තු 31 දින සිට 2024 ජුනි 11 දින දක්වා දෛනිකව රැස් කරගත් මුදල් බැංකු ගත කිරීමකින් තොරව වරින් වර අත රඳවා ගෙන තිබූ මුදල රු.733,652 ක් විය. එසේ මාස 02 කට අධික කාලයක් දෛනික මුදල් බැංකුගත නොකිරීම සම්බන්ධව වගකිව යුතු නිලධාරීන් සොයා බලා නිවැරදි කිරීම් සිදු කර නොතිබුණි. | ඉදිරියේදී මෙම අඩුපාඩුව නිවැරදි කරගැනීමට කටයුතු කරමි. | සීමාව ඉක්මවා මුදල් රඳවාගත් නිලධාරීන් සම්බන්ධයෙන් විධිමත් පියවර ගැනීමටත්, දෛනික මුදල් සීමාව රු.50,000 සීමාවේ තබාගෙන ඉතිරි මුදල් දෛනිකව බැංකුගත කරන බව තහවුරු වන පරිදි අභ්‍යන්තර පාලනය ශක්තිමත් කිරීමටත් පියවර ගත යුතුය. |
| (ඇ) | කනන්විල ගොවිජන බැංකුවේ 2024 ජනවාරි 01 දිනට අයවිය යුතු ව්‍යාපෘති ණය ශේෂය ලෙස පැවති ණයකරුවන් 14 දෙනෙකුට අදාළ එකතුව රු.612,887 ක මුදලක් 2024 වර්ෂයේ නොවැම්බර් මාසය තුළ අයකර ගෙන තිබූ බව දෛනික ලැබීම් ලේඛනය අනුව තහවුරු විය. 2015 හා 2016 වර්ෂවලදි ලබා දී තිබූ මෙම හිඟ ණය ශේෂවලට අදාළ හිඟ මුදල් එකවර ගෙවා පියවීම මතභේදයට තුඩු දෙන අසාමාන්‍ය ණය අයවීමක් විය. | පිළිගනිමි. | මේ සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණයක් පවත්වා මුදල් අවභාවිතාවයක් සිදු වී තිබේ නම් අදාළ පාර්ශව වෙත විධිමත් පරිදි කටයුතු කළ යුතුය. |

## 3.4 අරමුදල් ඌන උපයෝජනය

| | විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගොවිජන බැංකු 08 කට අයත් රාජ්‍ය වාණිජ බැංකු ගිණුම් 10 ක එකතු වටිනාකම රු.7,449,542 ක ශේෂයක් සහ කාරක සභා 11 කට අයත් රාජ්‍ය වාණිජ බැංකු ගිණුම් 17 ක එකතු වටිනාකම රු.10,808,871 ක මුදල් ශේෂයක් 2024 වර්ෂය තුල දී ඵලදායී කාර්යයකට භාවිතා නොකර නිශ්කාර්යව පැවති අතර එම මුදල් ඵලදායී කාර්යයකට භාවිතා කරන තෙක් වැඩි ආදායමක් ලැබෙන ආයෝජන මාර්ගයක යෙදවීමට ක්‍රියා කර නොතිබුණි. | එම මුදල් ප්‍රතිලාභ වැඩි ආයෝජන මාර්ගයක යෙදවීමට කටයුතු කරමි. | විධිමත් අනුමැතිය යටතේ කටයුතු කර මෙම මුදල් ඵලදායී ආයෝජන මාර්ගයක යෙදවීමට ක්‍රියා කළ යුතුය. |

## 3.5 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

| | විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කාරක සභා සහ ගොවිජන බැංකු 20 ක් මගින් පරිගණක උපාංග මිලදී ගැනීම සඳහා 2023 වර්ෂයේදී එකතුව රු.4,750,983 ක් හා 2024 වර්ෂයේදී එකතුව රු.1,052,374 ක් ලෙස එකතු වටිනාකම රු.5,803,357 ක් දිස්ත්‍රික් කාර්යාලය වෙත ගෙවීම් කර තිබුණි. 2024 වර්ෂය වන විට මෙම පරිගණක උපාංග ලැබී තිබුණ ද භාවිතා කිරීම සඳහා අවශ්‍ය විශේෂිත | පිළිගනිමි. | විධිමත් වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කර මෙම පරිගණක උපාංග කාර්යාල කටයුතු සඳහා භාවිතා කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | පරිගණක සහ පරිගණක මෘදුකාංග කාරක සභාව සතු නොවීම නිසා එම උපකරණ වසරකට වැඩි කාලයක සිට නිශ්ක්‍රීයව පැවතුණි. | | |
| (ආ) | මොරොන්තුඩුව කාරක සභාව වෙත 1997 වර්ෂයේ දී ජපන් ආධාර යටතේ ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව මගින් ගෙවීමේ පදනම මත ලබා දී තිබූ පොත් අගය රු.471,892 ක් වූ කුබෝටා ට්‍රැක්ටරය 2019 වර්ෂයේ සිට ඵලදායී කාර්යයකට භාවිතා නොකර වසර 06 කට වැඩි කාලයක් නිශ්ක්‍රීයව පැවතුණි. | පිළිගනිමි | මෙම ට්‍රැක්ටරය කාරක සභාවේ සහ ගොවීන්ගේ කාර්යයන් සඳහා භාවිතා කරවීමට විධිමත් වැඩපිළිවෙළක් යෙදිය යුතුය. |
| (ඇ) | කනන්විල කාරක සභාව වෙත 2018 වර්ෂයේදී පමණ ලැබී තිබූ " Olic " වර්ගයේ ශබ්ද විකාශන යන්ත්‍රය (Audio System) කළමනාකරණය විසින් ඵලදායී කාර්යයක් සඳහා භාවිතා නොකිරීම නිසා එම වත්කම ඌන උපයෝජිතව පැවතුණි . | පිළිගනිමි. 2025 සිට ඵලදායී කාර්යයකට භාවිතා කරමි. | මෙම ශබ්ද විකාශන යන්ත්‍රය ඵලදායී කාර්යයකට භාවිතා කිරීමට විධිමත් වැඩපිළිවෙළක් යෙදිය යුතුය. |
| (ඈ) | පමුණුගම කාරක සභා භූමිය තුල මිරිදිය මසුන් වගාකිරීම සඳහා ඉදිකළ ජල ටැංකි ඵලදායී කාර්යයකට භාවිතා නොකර නිෂ්කාර්යව පැවතුණි. | පිළිගනිමි. | මෙම ජල ටැංකි ඵලදායී කාර්යයකට භාවිතා කිරීම සඳහා විධිමත් වැඩපිළිවෙළක් යෙදිය යුතුය. |
| (ඉ) | ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව මගින් වරකාගොඩ කාරක සභාව වෙත ලබා දී තිබූ සේප්පුවක් වසර 11 කට වඩා වැඩිකාලයක සිට ප්‍රයෝජනයට ගෙන නොතිබුණු අතර අදාල සේප්පුවේ වටිනාකම පිළිබඳ තොරතුරු ලබාගෙන ගිණුම්ගත කිරීමට හා බඩු වට්ටෝරු පොත්වල ඇතුළත් කිරීමටද කටයුතු කර නොතිබුණි. | විවෘත කිරීමට නොහැකි අතර, ඒ සඳහා උපදෙස් ඉල්ලා ඇත. | සේප්පුව භාවිතයට ගැනීමට කටයුතු කිරීමත්, වට්ටෝරු පොත්වලට ඇතුළත් කිරීම හා වටිනාකම ගිණුම්ගත කිරීමත් කළ යුතුය. |
| (ඊ) | මදුරාවල කාරක සභාවේ පොහොර ගබඩාව ඉදිකර තිබූ ගොඩනැගිල්ල පිවිසුමේ පඩිපෙලක් ඉදිකර තිබීම නිසා පොහොර ගබඩාව තුළට පොහොර තොග ගෙන ඒමට අපහසු වීම හේතුවෙන් පොහොර ගබඩා කිරීමට භාවිතා නොකර වෙනත් අබලි ද්‍රව්‍ය ගබඩා කිරීම සඳහා භාවිතා කර තිබුණු අතර, වසර 07 කට ආසන්න කාලයක සිට ඌන උපයෝජිතව පැවතුණි. | මෙම පඩිපෙළ නිසා පොහොර බෑමට සහ පැටවීමට අපහසුතා පවතී. දියර පොහොර හා පැරණි පොත්පත් හා ලිපිද්‍රව්‍ය තැන්පත් කර ඇත. | විධිමත් පරිදි කටයුතු කර මෙම ගොඩනැගිල්ල සැලසුම් කළ කාර්ය සඳහා යොදා ගැනීම කළ යුතුය. |

**3.6 මානව සම්පත් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කාරක සභා 19 කට අදාලව කෘ.ප.නි.ස. වසම් 556 ක් පැවති අතර, අදාල වසම් සඳහා අනුයුක්ත කළ නිලධාරීන් සංඛ්‍යාව 394 ක් වීම හේතුවෙන් වසම් 162 ක් වැඩබලන නිලධාරීන් යටතේ පැවතුණි. | සේවක ඌනතාවය මත වැඩබැලීමට සිදුව ඇත. | වසමේ කාර්යභාරය, සේවා අවශ්‍යතාවය, නිලධාරීන්ගේ ධාරිතාවය පිළිබඳ අධ්‍යනය කර වසම්වල ගොවි ජනතාව |

| | | |
|---|---|---|
| | | වෙත සේවය කාර්යක්ෂමව ලබා දීම සඳහා පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතුය. |
| (ආ) කාරක සභා 08 කට අදාළව කම්ටු ලිපිකරු තනතුර සඳහා ස්ථිර සේවකයන් සේවයේ යෙදවීමට කටයුතු නොකිරීම නිසා තනතුර පුරප්පාඩු වී පැවතුණි. | සේවක ඌනතාවය මත තනතුර සඳහා නිත්‍ය නිලධාරීන් නොමැත. | තනතුරෙහි කාර්ය භාරය හා අත්‍යවශ්‍යතාවය සලකා නිත්‍ය නිලධාරීන් සේවයේ යෙදවිය යුතුය. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 මූල්‍ය ප්‍රකාශන විගණනයට ඉදිරිපත් කිරීම

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ III කොටස 16 (2) වගන්තිය සහ 2021 නොවැම්බර් 16 දිනැති අංක පී.ඊ.ඩී. 01/2021 දරන චක්‍රලේඛය සමග වූ "මෙහෙයුම් අත්පොතේ" 6.6 ඡේදය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුලත විගණකාධිපති වෙත ඉදිරිපත් කල යුතු වුවත්, කාරක සභා 19 ක මූල්‍ය ප්‍රකාශන දින 60 කට වැඩි කාල ප්‍රමාදයකින් පසුව විගණනයට ඉදිරිපත් කර තිබුණි. | 2025 වර්ෂයේදී මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. | 2025 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන චක්‍රලේඛ ප්‍රකාරව දින 60 ක් තුළ ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය. |

### 4.2 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) කාරක සභා 20 ක 2024 වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර තිබුණ ද එම සැලැස්ම නැවත 2024 දෙසැම්බර් 31 දිනට භෞතික හා මූල්‍ය ප්‍රගතිය ඉලක්ක සමග සන්සන්දනාත්මකව පරීක්ෂා කළ හැකි පරිදි හා කාරක සභාවල සියළු ක්‍රියාකාරකම් ඇතුළත්ව ඉලක්කගත ආදායම් හා වියදම් වර්ෂ අවසානයේ සත්‍ය ක්‍රියාකාරකම් සමග පරීක්ෂා කළ හැකි පරිදි එම සැලසුම් සකස් කර නොතිබුණි. | 2025 වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. | සියළුම ක්‍රියාකාරකම් ඇතුළත් කර ඉදිරි වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම නියමිත දිනට සකස් කර ලිඛිත අනුමැතිය ලබා ගැනීමටත්, හා ප්‍රගති වාර්තා සකස් කිරීමටත් කටයුතු කළ යුතුය. |

## 5. ගොවිජන බැංකු

| | විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගොවිජන බැංකු 15 ක් මගින් ගොවීන් 261 දෙනෙකු වෙත ලබා දී තිබූ එකතුව රු.6,215,367 ක ණය හා පොලී මුදල් අය නොවීම නිසා විනිශ්චය සභා වෙත යොමු කර තිබුණි. 2024 දෙසැම්බර් 31 දිනට එකතුව රු.1,003,757 ක මුදලක් පමණක් අයකර ගැනීමට හැකිවී තිබුණ අතර, එදිනට රු.4,881,454 ක් අයකර ගැනීමට නොහැකිවී පැවතුණි. නමුත් දිගු කාලයක සිට අයකර ගැනීමට නොහැකිව පැවති මෙම හිඟ ණය ශේෂ අයකර ගැනීම සඳහා නෛතික ක්‍රියාමාර්ග ගැනීමට ද කටයුතු කර නොතිබුණි. | මෙම හිඟ ණය අයකර ගැනීමට භෞතික ක්‍රියාමාර්ග ගනිමින් පවතී. | හිඟ ණය මුදල් කාලීනව අය කිරීමට කටයුතු නොකළ නිලධාරීන් සම්බන්ධව පියවර ගැනීමටත්, මෙම හිඟ ණය මුදල් කඩිනමින් අයකර ගැනීමට ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ආ) | ගොවිජන සේවා කාරක සභා 20 ක ගොවිජන බැංකු නියමු ව්‍යාපෘති මගින් 2024 දෙසැම්බර් 31 දිනට විවිධ ණය වර්ග යටතේ ගොවීන් 3413 දෙනෙකුගෙන් අයවිය යුතු එකතුව රු.129,574,295 ක ණය මුදලක් පැවතුණු අතර, එම මුදලින් ගොවිජන බැංකු 17 ක වසර 05 ඉක්ම වූ රු.6,380,043 ක ණය ශේෂයක් පැවතුණි. | මෙම පැරණි හිඟ ණය අයකර ගැනීමට කටයුතු කරමින් පවතී. | - එම- |
| (ඇ) | සීමාසහිත ගොවි සමාගමක් වෙත කනන්විල ගොවිජන බැංකුව මගින් 2000 වර්ෂයේදී ලබාදී තිබූ ගොවි සමාගම් "හිඟ ණය" මුදල වන එකතුව රු.854,900 ක මුදල වර්ෂ 24 කට වැඩි කාලයක සිට හිඟව පැවතුණ ද, එම ණය මුදල අයකර ගැනීමට ප්‍රමාණවත් ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | මෙම පැරණි ණය ශේෂය අයකර ගැනීමට කටයුතු කරමින් පවතී. | - එම - |
| (ඈ) | ගොවිජන බැංකු 08 කට අදාළව 2024 වර්ෂය සඳහා පවත්වාගෙන ගිය උපලෙජර් ගිණුම් පොත්වල ශේෂ යාවත්කාලීන කර පවත්වාගෙන ගොස් නොතිබූ අවස්ථා හෝ ගොවි බැංකු මූල්‍ය ප්‍රකාශන සමග විගණනයට ඉදිරිපත් කළ යුතු විවිධ තැන්පත්, පුද්ගල තැන්පත්, කොටස් වැනි උපලේඛනවල තැන්පතු ශේෂය, පොලිය සහ සමුච්චිත පොලිය නිවැරදිව සටහන් කර ඒවා යාවත්කාලීනව පවත්වාගෙන ගොස් නොතිබූ අවස්ථා පැවතුණි. | පිළිගනිමි. | ගිණුම් පොත්පත් නිසි පරිදි පවත්වාගෙන නොගිය නිලධාරීන් සම්බන්ධයෙන් පියවර ගැනීමටත්, උපලේඛනවල තැන්පතු ශේෂය, පොලිය, සමුච්චිත ශේෂය නිවැරදිව යාවත්කාලීන කිරීමටත් පියවර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | මොරොන්තුඩුව ගොවි බැංකු නියමු ව්‍යාපෘතිය භාරව රාජකාරී කටයුතු කළ කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාරවරිය ගොවි බැංකු නියමු ව්‍යාපෘතියේ භාවිතය සඳහා ලබා දී තිබූ පොදු මුදල් කුවිතාන්සි පොත් 03 ක් සහ වෙනත් ක්‍රම භාවිතා කරමින් රු.1,051,518 ක මුදලක් අවභාවිතා කර තිබූ බව අංක DAD/KL/SER/01/09 දරන 2024 නොවැම්බර් 25 දිනැති කළුතර දිස්ත්‍රික් ගොවිජන සංවර්ධන සහකාර කොමසාරිස්වරයාගේ ලිපියෙන් අනාවරණය කර තිබූ බව නිරීක්ෂණය විය. ඒ අනුව අදාල නිලධාරිනිය විසින් එම මුදල 2024 නොවැම්බර් 29 දින ගොවිජන බැංකු නියමු ව්‍යාපෘතියේ ගිණුම් අංකයට බැර කර තිබූ නමුත්, මෙම අක්‍රමිකතාව හඳුනාගෙන වසරක පමණ කාලයක් ගත වී තිබුණ ද විගණන පරීක්ෂාවන් සිදු කළ 2025 මැයි මස වන විටත් ආයතන සංග්‍රහය ප්‍රකාරව විනය ක්‍රියාමාර්ග ගැනීමට ක්‍රියාකිරීම වෙනුවට නිලධාරිනිය ස්ථාන මාරු කර සේවයේ යොදවා තිබුණි. | පිළිගනිමි. | ආයතන සංග්‍රහය ප්‍රකාරව විනය ක්‍රියාමාර්ග ගත යුතුය. |